# උත්ථාන සමයේ පස්වන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 14: 5-18

**"ඔබ රූප වන්දනාව අතහැර, අහස පොළොව මැවූ ජීවමාන දෙවිඳුන් වෙත හැරෙන පිණිස අපි සුබ අස්න ඔබ වෙත ගෙනාවෙමු"**

විජාතීන් ද ජුදෙව්වරුන් ද තමන්ගේ ප්‍රධානීන් සමඟ ඔවුන්ට නිග්‍රහ කරන්නටත් ගල් ගසන්නටත් අදහස් කළ කල්හි, ඔව්හු ඒ දැන, ලුකොනියාවේ නගර වන ලුස්ත්‍රාවට ද දර්බයට ද අවට පෙදෙස්වලට ද පලා ගොස් එහිදී සුබ අස්න දේශනා කළහ.

මවු කුස පටන් කොර වූ, පාද දුර්වල වූ, කිසි කලෙකත් ඇවිදගත නොහැකි වූ එක්තරා මිනිසෙක් ලුස්ත්‍රාවේ එක් තැනක වාඩි වී සිටියේය. ඔහු පාවුළු කතා කරනු ඇසීය. පාවුළු ඔහු දෙස බලා, ඔහු සුවය ලබන්නට තරම් සැදැහැ ඇත්තකු බව දැක, "නැඟිට පය බිම ගසා කෙළින් සිටින්නැ" යි මහත් හඬින් කීය. එවිට ඔහු පැන නැඟිට ඇවිද්දේය. එකල සමූහයා පාවුළු කළ දේ දැක ශබ්ද නගා, "දෙවිවරු මිනිස් වෙසින් අප වෙතට බැස සිටිති" යි ලුකෝනිය බසින් කීහ. ඔව්හු බර්ණබාස්ට සියුස් කියා ද, පාවුළු ප්‍රධාන කථිකයා බැවින් ඔහුට හෙර්මිස් කියා ද නම් තැබූහ. නුවර දොරටුවෙහි පිහිටි සියුස්ගේ දේවාලය පාලක පූජක තැන ගොනුන් ද මල්මාලා ද දොරටුව ළඟට ගෙනැවිත්, සමූහයන් සමඟ යාග කරන්නට සූදානම් විය. එහෙත් අපෝස්තුළුවරුන් වූ බාර්ණබස් ද පාවුළු ද ඒ අසා, තමන්ගේ වස්ත්‍ර ඉරාගෙන සමූහයා අතරට දිව ගොස්, මොර ගසා, "මනුෂ්‍යයෙනි, ඔබ මේ දේවල් කරන්නේ මන්ද? අපිත් ඔබ හා සමාන මිනිස්සු ය. ඔබේ මේ

නිෂ්ඵල දේ වලින් දුරුව අහසත් පොළොවත්, මුහුදත්, එහි ඇති සියල්ලත් මැවූ ජීවමාන දෙවියන් වහන්සේ වෙතට හැරෙන පිණිස සුබ අස්න ඔබ වෙත ගෙනෙමු. උන්වහන්සේ යටගිය පරම්පරාවල දී සියලු ජාතීන්ට තම තමන් සිතූ පැතූ ලෙස හැසිරෙන්නට ඉඩ හැරිය සේක. එහෙත් උන්වහන්සේ තමන් වහන්සේ ගැන සාක්ෂි නොදී සිටි කලක් නොවීය. මන්ද, උන්වහන්සේ අහසින් වර්ෂාව ද සාරවත් කාල සීමාවන් ද ඔබට දී ආහාරයෙන් හා ප්‍රීතියෙන් ඔබගේ සිත් පුරවමින් යහපත්කම් කළ සේකැ" යි කීහ. ඔවුන් එසේ කී නමුත්, තමන්ට පූජා ඔප්පු කිරීමෙන් ජනයා වළක්වා ගත හැකි වූයේ ඉතා අමාරුවෙනි.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 115:1b–4,15–16

පිළිතුර: සමිඳුනි, අප නිසා නොව, ඔබේ නාමයට මහිමය වේවා!

ගීය:

සමිඳුනි, අප නිසා නොව, ඔබේ තිර පෙම නිසාත්, සත්‍යවාදිකම නිසාත්, ඔබේ නාමය නිසාත් ඔබේ මහිමාලංකාරය ප්‍රකාශ කළ මැනව.

'ඔවුන්ගේ දෙවිඳාණෝ දැන් කොතැන්හි දැ"යි ජාතීන්ට අසන්නට ඉඩ දෙන්නේ කුමකටද?
අපේ දෙවිතුමාණෝ ස්වර්ගයෙහි ය. තමන් කැමති කුමන දෙයක් වුවත් එතුමාණෝ කරන සේක.
ඔවුන්ගේ දේවතා රූප රිදියෙන් හා රනින් ය. මිනිසුන්ගේ දෑතේ වැඩය.

අහසත් පොළොවත් මැවූ සමිඳාණෝ ඔබට ආශිර්වාද කරන සේක්වා! ස්ර්ගය වනාහි සමිඳුන්ට පමණක් අයිති ය. එහෙත් පොළොව එතුමාණෝ මිනිසුන්ට දුන් සේක.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳිය යුතු බවත්,
තුන්වනදා මළවුන්ගෙන් නැඟිටිය යුතු බවත්,
ශුද්ධ ලියැවිල්ලේ ලියා ඇත."

ආලේලූයා!

## සුවිශේෂය

සුවිශේෂක ජුවාම්තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 14: 21-26

**"පියාණන් වහන්සේ මා නමින් ඔබ වෙත එවන ශුද්ධාත්මයාණෝ ඔබට සියල්ල උගන්වන සේක."**

"මාගේ ආඥා පිළිගෙන ඒවා පිළිපදින යම් තැනැත්තෙක් වේ ද, මට ප්‍රේම කරන්නේ ඔහු ය. යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ ද මාගේ පියාණන් වහන්සේත් ඔහුට ප්‍රේම කරන සේක. මම ද ඔහුට ප්‍රේම කොට ඔහුට එළිදරව් වන්නෙමි" යි වදාළ සේක.

ජුදස් ඉස්කාරියෝත් නොවන අනෙක් ජුදාස් ජේසුස් වහන්සේ අමතා, "ස්වාමිනී, ඔබ වහන්ස් අපට එළිදරව් වී ලෝකයාට එළිදරව් නොවන්නේ කෙසේදැ" යි ඇසීය. ජේසුස් වහන්සේ ඔහුට පිළිතුරු දෙමින් "යම් තැනැත්තෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේය. මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේක. අපි ඔහු වෙතට පැමිණ ඔහු සමඟ වාසය කරන්නෙමු. මට ප්‍රේම නොකරන්නා මාගේ ධර්මය නොපිළිපදියි. ඔබ අසන ධර්මය මාගේ නොව මා එවා වදාළ පියාණන් වහන්සේගේ ධර්මය ය.

"ඔබ සමඟ සිටින අතර මම මේ දේවල් ඔබට කීවෙමි. එහෙත්, මාගේ නාමයෙන් පියාණන් වහන්සේ එවන සහායදායකයාණන් වහන්සේ, එනම්, ශුද්ධාත්මයාණන් වහන්සේ සියල්ල ඔබට උගන්වමින් මා වදාළ සියල්ල ඔබට සිහිපත් කරවන සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.